සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2013**

25674

## 9 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

නම/විභාග අංකය:- ............................................................................ කාලය: පැය 2යි.

### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40කි.
- 1-10 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි වඩාත් ශක්තිමත් කුසලාකුසල කර්ම නම්,

1. ගරුක කර්මයි.
2. ආසන්න කර්මයි.
3. දිට්ඨ ධම්ම වේදනීය කර්මයි.
4. උපඝාතක කර්මයි.

(02) බෝසතාණන් වහන්සේ උත්සාහයෙන් වීර්යයෙන් ප්‍රඥාවෙන් යුක්ත ව ක්‍රියා කොට අභියෝග ජයගත් අවස්ථාවක් දක්වෙන ජාතක කතාවක් වන්නේ,

1. සත්තු භත්ත ජාතකය.
2. සස ජාතකය.
3. වණ්ණුපථ ජාතකය.
4. ගුත්තිල ජාතකය.

(03) අවසන් බුද්ධ වචනය ඇතුළත් ගාථා පාඨය වන්නේ,

1. "අග්ගෝ හමස්මි ලෝකස්ස".
2. "හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වෝ".
3. "යථා අඤ්ඤතරං බීජං".
4. "යේ ධම්මා හේතුප්පභවා".

(04) ත්‍රිවිධ ශික්ෂාවෙහි ශීලයට අදාළ මාර්ග අංගයක් ලෙස "සම්මා ආජීව" හැඳින්විය හැකිය. එයට අදාළ නොවන්නේ,

1. පලතුරු වෙළෙඳාම.
2. එළවළු වෙළෙඳාම.
3. කිරිපිටි වෙළෙඳාම.
4. මාළු වෙළෙඳාම.

(05) "ඇම පමණින් පැවසූ මුනි දන තතු" මෙම පද්‍යය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

1. ලෝ වැඩ සඟරාව.
2. ලෝකෝපකාරය.
3. ගුත්තිල කාව්‍යය.
4. සිරිත් මල්දම.

(06) කමලා රිය අනතුරක් නිසා පාර අයිනේ වැටී සිටි අසරණ මිනිසෙකු දැක "මේ මිනිසාගේ ජීවිතය බේරා ගැනීමට හැකි පමණින් උදවුවක් කළ යුතුයි" සිතා වතුර වීදුරුවක් ගෙනැවිත් දුන්නාය. ඇය තුළ පහළ වූ සිතිවිල්ල,

1. මෛත්‍රී සහගත සිතිවිල්ලකි.
2. කරුණාවෙන් යුතු සිතිවිල්ලකි.
3. මුදිතාවෙන් යුතු සිතිවිල්ලකි.
4. උපේක්ෂා සහගත සිතිවිල්ලකි.

(07) මනුෂ්‍යත්වය ඉක්මවා බ්‍රහ්මත්වයට පත් වීමට සතර බ්‍රහ්ම විහරණ හේතු වේ. මෙම ගුණයෙන් යුක්ත ව මෙලොව වාසය කරන පුද්ගලයින් වන්නේ,

1. දෙමවුපියන්.
2. ගුරුවරුන්.
3. නෑදෑයින්.
4. මහණ බමුණන්.

(08) බලදේව උපාසකතුමා දෙවියන් පිළිබඳ මහත් වූ බියකින් යුක්ත ව දේව කරුණාව ලබා ගැනීමේ අදහසින් පුද පූජා පවත්වා දෙවියන් පුදයි. දෙවියන් අදහයි. ඔහු තුළ ඇත්තේ,

1. ශ්‍රද්ධාවයි.
2. ආකාරවතී ශ්‍රද්ධාවයි.
3. අමූලිකා ශ්‍රද්ධාවයි.
4. භක්තියයි.

(09) සතුන්ට ආහාර ලබා දීම, නෑමට ජල බඳුනක් තැබීම, මරණයට නියම වූ සතෙකු බේරා ගැනීමට පිං කැටයක් පවත්වාගෙන යෑම. ඉහත කරුණු තුන මඟින් සංවර්ධනය වන උතුම් ගුණාංගය වන්නේ,

1. සතුන්ගේ පිරිසිදුකම අගය කළ යුතු බව.
2. සතුන්ට ආහාර පාන ලබා දිය යුතු බව.
3. සතුන්ට සැලකිය යුතු බව.
4. සත්ත්ව හිංසාවෙන් වැළැකී සියලු සතුන්ට ආදරය කරුණාව දක්විය යුතු බව.

(10) සමහර සිසුහු ප්‍රචණ්ඩකාරී ව, සැඩ පරුෂ ව, අන්‍යයන්ට හිංසාකාරී ව ක්‍රියා කරති. පොදු දේපළ විනාශ කරති. මේ නිසා ගුරු දෙගුරුන්ගේ හා නුවණැත්තන්ගේ දෝෂාරෝපණයට ලක් වෙති. එම තත්ත්වයෙන් මිදී යහ මඟට යොමු වීමට කළ යුතු **නොවන්නේ**,

1. තම ක්‍රියා නිසා ඇති වන අහිතකර ප්‍රතිඵල ගැන සොයා බැලීම.
2. තමා කරන ක්‍රියාව වරදක් බව පිළිගැනීම.
3. ගුරුදෙගුරු උපදෙස් පිළිපැදීම.
4. පවිටු මිතුරන් ඇසුරු කිරීම.

- පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් '✓' ලකුණ ද වැරදි නම් '×' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(11) අශෝක රජු දිග් විජය අතහැර ධර්ම විජයට ප්‍රවිෂ්ට වූයේ කාලිංග යුද්ධයෙන් පසු ය. ( )

(12) සියලු දේ හේතුවකින් තොරව ඉබේ සිදුවේ. ( )

(13) "පරක්කම ධාතු" යනු බාධා මැඩගෙන ඉදිරියට යෑමයි. ( )

(14) මරණයට නියම වූ සතෙකු ඉන් මුදවා ගැනීම අභය දානය ලෙස හැඳින්වේ. ( )

(15) කෘත්‍රිම රසකාරක අඩංගු ආහාර ශරීරයට හිතකර වේ. ( )

- A කොටසට ගැළපෙන පදය B කොටසින් තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| (16) | තම්බපණ්ණී දේශයේ දී දහම් දෙසූ සූත්‍රය | අසූ වියේ දී |
| (17) | අකුසල කර්මයට මුල් වන චේතනා | චූල්ලහත්ථිපදෝපම සූත්‍රය |
| (18) | අනුපදිසේස පරිනිබ්බානය සිදු වූයේ | චුල්ල සෙට්ඨි ජාතකය |
| (19) | පුරිසදම්ම සාරථී බුදු ගුණය ඇතුළත් වේ | රාග,ද්වේෂ,මෝහ |
| (20) | උත්සාහයෙන් දියුණු විය හැකි බව කියවේ | අමාවතුර |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු වැනි ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. අනෙත් ප්‍රශ්නවලට 10 බැගිනි.**

---

01. තෙවැනි පාසල් වාරයේ දී ගුරු මඟපෙන්වීම මත පාසල් පාදක ඇගයීම් යටතේ ඔබ විසින් කරන ලද ප්‍රශ්නෝත්තර පොත පිළිබඳ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) එම පොත සකස් කිරීම සඳහා ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.

(ii) ප්‍රශ්න සකස් කිරීම සඳහා ඔබ උපයෝගී කරගත් පෙළ පොතේ ඇති පාඩම් මාතෘකා දෙකක් සඳහන් කරන්න.

(iii) පොත නිර්මාණය කිරීමේ දී විවිධ පුද්ගලයින්ගෙන් ඔබ ලබාගත් උදවු දෙකක් සඳහන් කරන්න.

(iv) පොතේ පිට කවරයට ඇතුළත් කරන ලද කරුණු දෙකක් ලියා දක්වන්න.

(v) පොත පිටු කීයකින් සමන්විත වී ද? එහි ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව කීය ද?

(vi) කිසියම් ක්‍රියාවක් ආරම්භ කොට ඉදිරියට පවත්වාගෙන යෑමේ දී අනුගමනය කළ යුතු පියවර හයක් අත්තකාර සූත්‍රයේ දක්වේ. ඉන් ඔබ අනුගමනය කළ කරුණු දෙකක් සඳහන් කරන්න.

(vii) පොත සැකසීමේ දී ඔබට මුහුණ පෑමට සිදු වූ අභියෝග දෙකක් ලියන්න.

(viii) ඔබ එම අභියෝගවලට මුහුණ දී ලබාගත් විසඳුම් ලියා දක්වන්න.

(ix) අටලෝ දහමට අයත් අංග අටෙන් හතරක් නම් කරන්න.

(x) 'මිච්ඡා ආජීවයට' අයත් වන ජීවනෝපාය ක්‍රම දෙකක් දක්වන්න.

(2 × 10 = 20)

02. (i) යම් ක්‍රියාවක් කර්මය වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) විපාක දෙන කාලය අනුව කර්මය බෙදෙන ප්‍රධාන කොටස් හතරෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) යම් ක්‍රියාවක් කුසල කර්මයක් හෝ අකුසල කර්මයක් වීම සඳහා චේතනාව මුල් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. ක්‍රි.පූ 6 වැනි සියවසේ භාරතයේ පහළ වූ අති ශ්‍රේෂ්ඨ ආගමික නායකයෙක් ලෙස බුදුන් වහන්සේ හැඳින්විය හැකිය.

(i) උන් වහන්සේ තුළ පැවති යථාවාදී තථාකාරී ගුණය කෙටියෙන් දක්වන්න. (ලකුණු 02)

(ii) බුද්ධ චරිතය තුළින් විද්‍යාමාන වන වෙනත් නායකත්ව ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ඔබ ශිෂ්‍ය නායකයෙකු යැයි සිතා ඉහත නායකත්ව ලක්ෂණ ඔබේ ජීවිත සාර්ථකත්වයට භාවිත කළ හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

04. අප විසින් කරනු ලබන කටයුතු සාර්ථක කරගැනීම සඳහා නිරෝගී, ශක්තිමත් සිතක් පැවතිය යුතුය. ඒ සඳහා සිත එකඟ කරගැනීමට වැඩිය හැකි භාවනාවක් ලෙස ආනාපානසති භාවනාව හැඳින්විය හැකිය.

(i) ''ආන'' හා ''අපාන'' යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) ආනාපානසති භාවනාවේ පළමු පියවරට පෙර ඔබ විසින් අනුගමනය කළ යුතු කරුණු 3ක් දක්වන්න. (ලකුණු 03)

(iii) භාවනාව තුළින් සන්සුන් වූ සිතක් ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකුට වැදගත් වන අයුරු විස්තර කරන්න. (ලකුණු 05)

05. (i) ''බ්‍රහ්ම විහාර'' යන්නෙහි අදහස පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) සිවු බඹ විහරණවලින් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) පුද්ගල ජීවිතයේ යහ පැවැත්මට ඉන් එක් කරුණක් ඉවහල් වන අයුරු විස්තර කරන්න. (ලකුණු 05)

06. යහපත් සමාජ සම්බන්ධතා පිළිබඳ පැහැදිලි කෙරෙන වැදගත් සූත්‍ර දේශනාවක් ලෙස සිගාලෝවාද සූත්‍රය හැඳින්විය හැකිය.

(i) එහි ''උද්ධං සමණ බ්‍රාහ්මණා'' යන්නෙන් පැහැදිලි කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) එම සූත්‍රයට අනුව පැවිදි පක්ෂය විසින් ගිහියා වෙත ඉටු කළ යුතු යුතුකම්වලින් තුනක් දක්වන්න. (ලකුණු 03)

(iii) මහ සඟ රුවන වෙනුවෙන් ගිහියා විසින් ඉටු කළ යුතු යුතුකම් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. බුදුන් වහන්සේ හමුවට පැමිණි එක්තරා දේවතාවෙක් ''ඇතුළත් අවුල්ය, පිටත ද අවුල්ය, ලෝ වැස්සෝ අවුලෙන් අවුලට පත් ව සිටිති. එහෙයින් ගෞතමයන් වහන්ස, කවරෙකු විසින් මේ අවුල් නිරවුල් කරන්නේද''යි විමසීය. බුදුරජාණන් වහන්සේ ''ත්‍රිශික්ෂාවෙහි පිහිටන තැනැත්තා එම අවුල් නිරවුල් කරන බව'' වදාළ සේක.

(i) ත්‍රිවිධ ශික්ෂාවට අයත් අංග තුන අතරින් තෘෂ්ණාව නැති කොට චතුරාර්ය සත්‍යාවබෝධයට හේතු වන්නා වූ අංගය කුමක් ද? (ලකුණු 02)

(ii) සම්මා සංකප්ප බෙදෙන ප්‍රධාන කොටස් තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිවිධ ශික්ෂාවට ඇතුළත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

ග .......... ඝ